**සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - 2016**

**------------------------------------------------**

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 10 දරන සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ 21 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

2015 වර්ෂයට අදාල පාරිතෝෂික හා ක්ෂය වෙනුවෙන් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සිදු කරන ලද පිළිවෙලින් රු.650,410 ක හා රු.187,907 ක ගැලපීම් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහයට ගලපා තිබුණු අතර, එකතුව රු.1,130,822 ක පෙර වර්ෂ ගැලපුම් වටිනාකමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයට ගලපා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය, සෑම වර්ෂයකම වාර්තා කරන කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කර ගිණුම්කරණ ඇස්තමේන්තුව වෙනස්වීමක් ලෙස සලකා ක්ෂය කළ හැකි කාල පරිච්ඡේදය සමාලෝචනය කළ යුතු වුවද අධිකාරිය විසින් ක්ෂය කර අවසන් වුද දැනට භාවිතා කරන එකතුව රු.මිලියන 20.89 ක වත්කම් සම්බන්ධයෙන් ප්‍රමිතයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09

තොග අගය කළ යුත්තේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට වුවද, අධිකාරිය විසින් ඊට අනුකූල නොවන පරිදි තොග සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් සකස් කර ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමකින් තොරව, පිරිවැය මත තොග අගය කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේදී ගෙවා අවසන් කළ කාර්යාල කුලී නැවත ප්‍රතිපාදනය කර තිබූ බැවින් කාර්යාල කුලී ගිණුම හා උපචිත කාර්යාල කුලී ගිණුම රු.115,802 කින් අධිගණනය වී තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී විශ්‍රාම ගිය නිලධාරියෙකු වෙනුවෙන් වෙන්කර තිබූ රු.315,418 ක පාරිතෝෂික මුදල් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවීමට හෝ ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

අධිකාරිය විසින් අවසන් ගිණුම් සකස් කිරීමේදී එකතුව රු. මිලියන 262.99 ක ගැලපීම් සඳහා ජර්නල් වවුචර් පිළියෙල කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 25.83 ක් වූ ණයගැති ශේෂයෙන් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද ණයගැතියන් 08 දෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂය රු. මිලියන 3.05 ක් විය. තවද ණයගැති ශේෂය තහවුරු කිරීම සඳහා ශේෂ සනාථනද විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.මිලියන 4.65 ක ශේෂයෙන් රු. මිලියන 1.37 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පියවා නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම සඳහා අධිකාරිය වෙත ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබාදී තිබුණු රු.350,568 ක අත්තිකාරම් මුදල 2017 මැයි මාසය අවසානය දක්වා පියවා නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2003 අංක 24 දරන සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනතේ 5 ඡේදයේ (ඌ) වගන්තිය | සභාධිපත්‍ය දේපලවල පොදු පහසුකම් නඩත්තු කිරීමේ කටයුතු පළාත් පාලන ආයතන වෙත පැවරිය යුතු වුවත්, මාළිගාවත්ත සහ ජල්තර නිවාස ක්‍රමවල පොදු පහසුකම් නඩත්තු කිරීමේ කටයුතු පළාත් පාලන ආයතන වෙත පවරා නොතිබුණි. |
| (ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී රජයේ නිලධාරීන්ට ලබාදෙන ඉන්ධන දීමනාව සහ දුරකථන දීමනාව බදු අයකල හැකි ආදායමට එකතු කළ යුතු වුවද, අධිකාරියේ නිලධාරීන්ට ලබාදී තිබුණු ඉන්ධන දීමනා හා දුරකථන දීමනා ගැලපීමෙන් තොරව උපයන විට ගෙවීම් බදු ගණනය කර තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

-------------------------------------------

| | |
|---|---|
| (i) II වන පරිච්ඡේදයේ 13.3 ඡේදය | වැඩ බැලීමේ පත්වීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද, අධිකාරියේ තනතුරු 08 ක් සඳහා වැඩබැලීමේ පත්වීම් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ බැලීමේ කාලය මාස 04 සිට වර්ෂ 05 දක්වා විහිදී තිබුණි. අධිකාරිය 2016 වර්ෂයේදී වැඩ බැලීමේ දීමනා ලෙස රු.501,097 ක් ගෙවීම් කර තිබුණි. |
| (ii) VIII වන පරිච්ඡේදයේ 9.2 ඡේදය | එකම රාජකාරි කාලය සඳහා නිවාඩුදින දීමනා (1/30) සහ අතිකාල දීමනා යන දීමනා දෙකම ගෙවිය නොහැකි වුවත්, එයට අනුකූල නොවන පරිදි 2010 ඔක්තෝබර් 29 දිනැති අංක CMA/4/1/3/7 (කා.නි.) දරන අධිකාරියේ සාමාන්‍යාධිකාරිගේ ලිපිය ප්‍රකාරව එකම සේවා කාලය සඳහා කාර්යාල සහායක, ගිණුම් නිලධාරින් , භාරකරු, කළමනාකරණ සහකරුවන් හා කාර්යාල කම්කරුවන් වැනි ශ්‍රේණි සඳහා දීමනා දෙකම එකවර ගෙවා තිබු අතර එලෙස අතිකාල දීමනාවට අමතරව ගෙවු නිවාඩු දින දීමනාව රු. මිලියන 1.68 ක් විය. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

----------------------------------------------

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 371 (2) (ආ) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් තත්කාර්යය අතුරු අග්‍රිම ලබාදිය යුතු වුවද, අධිකාරිය විසින් ඊට අනුකූල නොවන පරිදි මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත අවස්ථා 87 කදී එකතුව රු.990,008 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | ව්‍යාපෘති සම්පූර්ණ කල දින සිට වර්ෂ 02 ක් ඉක්මවු ආරක්ෂිත තැන්පතු හා රඳවාගත් මුදල් පිළිවෙලින් රු. 655,487 ක් හා රු.3,470,000 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 757(2) සහ 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 3 ඡේදය | 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, අංශ 14 ක අයිතම 72 ක ඌනතාවය හා අයිතම 62 ක අතිරික්තය සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගෙන නොතිබුණි. |

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

----------------------------------------------

| | |
|---|---|
| (i) 2.8.1 ඡේදයේ (ආ) | විෂය පිළිබඳ විශේෂඥයකුගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත විය යුතු වුවද සහාධිපත්‍ය අත්පොත් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් වූ තාක්ෂණික ඇගයීම් කමිටුව විෂය පිළිබඳ විශේෂඥයකුගෙන් සමන්විත නොවූ අතර ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර, කළමනාකරණ සහකාර (තාක්ෂණික) හා කළමනාකරණ තොරතුරු පද්ධති නිලධාරින්ගෙන් සමන්විත වී තිබුණි. |

| | |
|---|---|
| (ii) 4.2.1 ඡේදය | විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර, අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගතකර නොතිබුණි. |
| (iii) 8.9.1 ඡේදය | වටිනාකම රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු බව සඳහන් වුවද, රු.මිලියන 1.66 ක් වටිනා සහාධිපත්‍ය අත්පොත් මුද්‍රණය කිරීමේ කාර්යය සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. |
| (ඊ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ<br>---------------------------------------------- | |
| (i) 6.5.1 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 8.2.2 ඡේදය | මූල්‍ය වාර්තාවල දක්වා තිබුණු රු.මිලියන 55 ක සත්දින තැන්පතු සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iii) 8.3.8 ඡේදය | යොමුගත චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. මිලියන 8.75 ක් පරිත්‍යාග සඳහා වැයකර තිබුණි. |
| (උ) රාජ්‍ය මුදල් චක්‍රලේඛය<br>--------------------------- | |
| (i) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛය | ලබාගත් අග්‍රිමයක් එම කාර්යය නිමවූ විගසම පියවිය යුතු වුවද, අවස්ථා 79 කදී ලබාගත් රු. මිලියන 1.39 ක අතුරු අග්‍රිම පියවීමට දින 17 සිට දින 115 දක්වා වූ කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. එසේ ප්‍රමාදවීම් තිබූ නිලධාරීන්ගේ පළමු අග්‍රිමය පියවීමට පෙර නැවත අග්‍රිම ලබාදී තිබූ අවස්ථාද විගණනයේදී නිරීක්ෂණය විය. |
| (ii) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | 2016 වර්ෂයේදී අපහරණය කරනු ලබන සියළුම භාණ්ඩ සම්බන්ධයෙන් වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) 2009 ජුලි 21 දිනැති අංක පීඑෆ්/439 දරන චක්‍රලේඛය | භාවිතයෙන් ඉවත් කර ඇති ටයර් වෙන්දේසියට ඉදිරිපත් නොකර ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු වුවත්, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී ටයර් 32 ක් විනාශ කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඍ) | අධිකාරියේ ජොෂ්ය කළමනාකරණ බඳවා ගැනීමේ පරිපාටියේ 8.2 ඡේදය | අධිකාරියේ සාමානායාධිකාරි බඳවා ගැනීමේ වයස් සීමාව අවුරුදු 45 ට නොවැඩි විය යුතු වුවද ඊට අනුකූල නොවන පරිදි වයස අවුරුදු 45 ට වැඩි අයෙකු බඳවාගෙන තිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

---------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ අතිරික්තය රු.මිලියන 70.41 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 21.97 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 48.44 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සැසඳීමේදී වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම් රු.මිලියන 11 කින් අඩුවුවද, මෙහෙයුම් ආදායම රු. මිලියන 76.8 කින් ඉහළ යාම ඉහත වර්ධනයට මූලික හේතුව වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනය කිරීමේදී 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් පෙන්නුම් කළ නමුත් අනෙකුත් වර්ෂවල අතිරික්තයක් ලබා තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු ආයතනයේ සමස්ත දායකත්වය 2012 වර්ෂයේ සිට 2016 දක්වා වර්ධනයක් පෙන්නුම් කර තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම වර්ධනය සියයට 53 ක් විය.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සහාධිත්‍ය දේපල සඳහා සහතික නිකුත් කිරීමේ ආදායම රු. මිලියන 83.66 කින් එනම් සියයට 107 කින් ඉහළ යාම හේතුකොට ගෙන සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු. මිලියන 76.8 කින් එනම් සියයට 72 කින් වර්ධනය වී තිබුණි. එසේම ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම වැඩිවීම හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් නොවන ආදායම රු. මිලියන 6.16 කින් එනම් සියයට 120 කින් වර්ධනය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ශුද්ධ වත්කම් රු. මිලියන 102.79 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ වත්කම් රු. මිලියන 33.51 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමග සැසඳීමේදි ශුද්ධ වත්කම් රු. මිලියන 69.28 කින් වර්ධනයවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අධිකාරිය රු. මිලියන 70.41 ක අතිරික්තයක් ලැබීම උක්ත වර්ධනයට මූලිකවම හේතුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වත්කම් අනුපාතය 1.7:1 ක් වූ අතර පසුගිය වර්ෂයේ එම අනුපාතය 1.2:1 ක් විය. එසේම සමාලෝචිත වර්ෂයේදී ක්ෂණික වත්කම් අනුපාතය 1.6:1ක් වූ අතර 2015 වර්ෂයේදී එම අනුපාතය 1.2:1 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

----------------

සහාධිපත්‍ය දේපලවල පොදු පහසුකම් කළමනාකරණය, නඩත්තුව, පාලනය හා පරිපාලනය කිරීම, ඒවා නිසිලෙස ඉටුකිරීම සඳහා කළමනාකරණ සංස්ථාවට මග පෙන්වීම හා ඒ සඳහා සහායවීම සහ නඩත්තුව පැහැර හරින අවස්ථාවන්හිදී ඍජුව මැදිහත් වීම 1973 අංක 10 දරන සහාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත අනුව අධිකාරියේ ප්‍රධාන අරමුණ විය. අධිකාරියේ කාර්යසාධනය සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රගති සමාලෝචන වාර්තාව අනුව, ඉලක්කගත කළමනාකරණ කමිටු ලියාපදිංචි කිරීමේ සංඛ්‍යාව 75 ක් වුවද, 2016 වර්ෂය තුළදී කළමනාකරණ කමිටු 33 ක් පමණක් ලියාපදිංචි කර තිබුණු බැවින් ප්‍රගතිය සියයට 44 ක් විය.

(ආ) 2016 වර්ෂයේදී අනවසර ඉදිකිරීම් හඳුනාගෙන පරීක්ෂණ පවත්වා ඒ පිළිබඳව අදාල පාර්ශවයන් දැනුවත් කර ඔවුනට සාධාරණ කාලයක් ලබාදී ඉදිකිරීම් 75 ක් ඉවත් කිරීමට කටයුතු කිරීමට හා ඉවත් කිරීමට දරන ලද වියදම අදාල පාර්ශවකරුවන්ගෙන් අයකර ගැනීමට සැලසුම් කර තිබුණද 2016 වර්ෂයේදී ඉවත් කරන ලද සත්‍ය අනවසර ඉදිකිරීම් ගණන 05 ක් විය. එසේම 2016 වර්ෂයේදී අනවසර ඉදිකිරීම් හඳුනාගැනීමට කටයුතු කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම සංගණන වාර්තාව සකස් කර නොතිබුණි.

(ඇ) සහාධිපත්‍ය දේපල 80 ක් රක්ෂණය කිරීම සඳහා කළමනාකරණ සංස්ථා පෙළඹවීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී දේපල 56 ක් පමණක් රක්ෂණය කර තිබුණු අතර ඉතිරි දේපල රක්ෂණය කිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි. තවද 2017 ක්‍රියාකාරී සැලැස්මට අනුව ද සහාධිපත්‍ය දේපල 160 ක් රක්ෂණය කිරීමට කටයුතු කරන බවට සැලසුම් කර තිබුණි.

(ඈ) සුනාමි ව්‍යසනයට පත්වූ ජනතාව සඳහා ඉදිකරන ලද සහාධිපත්‍ය නිවාස ක්‍රම 112 ක් වෙනුවෙන් රු.මිලියන 10 ක ප්‍රතිපාදන මත සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීමේ සහතික ලබාදීමට ඉලක්ක කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ඉන් එකදු සහතිකයක් වත් ලබාදීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඉ) 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනත සංශෝධන කටයුතු අදියරයන් 05 ක් යටතේ එනම් විද්වත් කමිටු සැසි පැවැත්වීම, සංශෝධිත කෙටුම්පත් වාර්තාව අවසන් කිරීම, කැබිනට් අනුමැතියට ඉදිරිපත් කිරීම, ගැසට් පත්‍රයේ පලකිරීම, පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම, යනාදිය ක්‍රියාත්මක කර 2015 නොවැම්බර් මාසයේ අවසන් කිරීමට 2015 ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කර තිබුණද එම කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් 2016 ක්‍රියාකාරී සැලැස්ම අනුව 2016 නොවැම්බර් මාසයේ යථෝක්ත කාර්යයන් අවසන් කිරීමට නැවත සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද විද්වත් කමිටුව පත්කර එක් රැස්වීමක් පමණක් 2016 දෙසැම්බර් මාසයේ පවත්වා තිබුණි.

(ඊ) අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, ඉලක්ක ගත කළමනාකරණ සංස්ථා නියෝජිත හමුව, කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළුව, කොළඹ දිස්ත්‍රික්කයේ පලාත් පාලන නියෝජිතයින් දැනුවත් කිරීමේ වැඩමුළුව හා දේපල සංවර්ධකයින්ගේ හමුව සමාලෝචිත වර්ෂයේදී පවත්වා නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

අධිකාරියට අවශ්‍ය භාණ්ඩ වර්ග 02 කින් අයිතමයන් 750 ක් ලබා ගැනීමට පෞද්ගලික සමාගමක් වෙත 1999 වර්ෂයේදී රු. මිලියන 2.02 ක් ගෙවීම් කර තිබුණු අතර, රු. මිලියන 1.22 ක් වටිනා අයිතමයන් 545 ක් 2000 වර්ෂයේදී අධිකාරියට ලැබී තිබුණි. ඉතිරි භාණ්ඩ නොලැබීම හේතුවෙන් 2006 වර්ෂයේදී අධිකාරිය විසින් පවරා තිබුණු නඩුව සම්බන්ධයෙන් අධිකරණය ලබාදුන් තීන්දුවට අනුව කටයුතු කර අදාල මුදල් පියවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1973 අංක 10 දරන සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පනතට අනුව අධිකාරිය විසින් සහාධිපත්‍ය දේපළ වල කළමනාකරණ සංස්ථා සක්‍රීයව පවත්වා ගෙන යායුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරිය විසින් පිහිටුවන ලද කළමනාකරණ සංස්ථා 872 කින් 427 ක් එනම් සියයට 49 ක් අක්‍රීයව පැවතුණි.

(ආ) 2016 මැයි 25 දිනැති 108 වැනි කළමනාකරණ මණ්ඩල රැස්වීම් තීරණය මත අධිකාරියේ සභාපති විසින් රචිත "සහාධිපත්‍ය දේපළ වල සතුටින් හා නිරෝගීව ජීවත්වීමේ රටාව" නමින් කෘතියක් එළි දැක්වීමට හා එහි මුද්‍රණ වියදම් අධිකාරියේ අරමුදලින් දරා එම වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට තීරණය කර තිබුණු නමුත් අධිකාරිය විසින් රු. මිලියන 1.67 ක වියදමක් දරා "Condominium Living The Emerging Trend" නමින් ඉංග්‍රීසි මාධ්‍ය පොතක් මුද්‍රණය කර තිබුණි. මෙහි කතෘ හිමිකම සභාපතිවරයා සතු වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මුද්‍රණ වියදම් පියවා ගැනීමටද අධිකාරියට නොහැකිවී තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

------------------------------

නගමු පුරවර ව්‍යාපෘතිය යටතේ මහල් නිවාස 03 ක යටිතල පහසුකම් නවීකරණය කිරීම සඳහා 2015 හා 2016 වර්ෂයන්හිදී භාණ්ඩාගාරයෙන් රු.මිලියන 80 ක් ලැබී තිබුණු නමුත් අපේක්ෂිත කාර්යයන් නිසි පරිදි ඉටුකිරීමට නොහැකිවීම හේතුවෙන් රු.මිලියන 32.7 ක් කිසිදු කාර්යයක නොයොදා 2016 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වගන්තියට අනුකූල නොවන පරිදි අධිකාරිය විසින් 2006 ජනවාරි මාසයේ සිට 2013 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව අදාල කර ගෙන නොතිබීම හේතුවෙන් එම කාලසීමාව සඳහා අධිකාරිය විසින් ගෙවා තිබුණු රු.මිලියන 11.18 ක හිඟ සේවක අර්ථසාධක අරමුදල තුළ ඇතුලත් සේවකයින්ගේ කොටස වූ රු.මිලියන 4.47 ක් අදාල පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම හිඟ මුදල් වෙනුවෙන් රු.මිලියන 6.36 ක අධිභාර මුදලක් ගෙවීමට අධිකාරියට සිදුවී තිබුණු අතර 2016 වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.මිලියන 2.94 ක් ගෙවීම් කර තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 139 ක් හා 103 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 36 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය, සංවිධාන සටහන හා බඳවාගැනීමේ පරිපාටිය අනුව නීති කටයුතු වෙනුවෙන් සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු දෙකක් සඳහා අනුමැතිය ලබාදී තිබුණු නමුත් එක් තනතුරක් සඳහා පමණක් ස්ථිර නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. 2008 වර්ෂයේ සිට දෛනික ගෙවීම් පදනම මත තවත් නීති නිලධාරියකුගේ සේවය ද ලබා ගන්නා අතර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් එම නීති නිලධාරිගේ කාර්යයන් වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.443,000 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) බඳවා ගැනීමේ පරිපාටියට අනුව නගර නිර්මාණ ශිල්පී තනතුර අනුමත කර නැති වුවද, 2009 වර්ෂයේ සිට වරලත් නගර නිර්මාණ ශිල්පියෙකු උපදේශකයෙකු ලෙස අධිකාරියේ කාර්යයන් සඳහා දෛනික ගෙවීම් පදනමින් බඳවා ගෙන තිබුණි. මේ අනුව සේවයේ අවශ්‍යතාවය සලකා බලා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කර ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. 2016 වර්ෂයේදී එම නිලධාරියා වෙනුවෙන් අධිකාරිය විසින් රු.207,000 ක වියදමක් දරා තිබුණු නමුත් ඔහුගේ කාර්යසාධනය සම්බන්ධ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) දෛනික ගෙවීම් පදනම මත අධිකාරිය විසින් පරීක්ෂණ නිලධාරියෙකුගේ සේවය ලබා ගන්නා අතර, ඒ සඳහා 2016 වර්ෂය තුළ රු.129,000 ක වියදමක් දරා තිබූ නමුත් එම පත්වීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හෝ පත්වීමේ ලිපියක් විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ඈ) අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නියාමන) තනතුර සහ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු 03 ක් දීර්ඝ කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවතීම ආයතනයේ කාර්යසාධනයට සෘජුවම බලපා නැතැයි යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඉ) පුරප්පාඩු වූ ද්විතීයික තනතුරු 24 ක් සහ ප්‍රාථමික තනතුරු 06 ක් සඳහා නිලධාරීන් බඳවාගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

## 4.7 වාහන උපයෝජනය

අධිකාරිය විසින් පැරණි වාහන ඉවත්කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 1998 හා 1999 වර්ෂයන්හි රු.මිලියන 8.93 ක පිරිවැයකට ලබාගත් කැබ්රථ 03 ක නඩත්තු කටයුතු වෙනුවෙන් 2016 වර්ෂය තුලදී රු.මිලියන 2.47 ක් වියදම් කර තිබුණු අතර 1995 වර්ෂයේදී මිලදීගත් පිරිවැය රු.690,000 ක් වූ ට්‍රැක්ටරයේ හා ටේලරයේ නඩත්තු කටයුතු වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.205,649 ක් වියදම් කර තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් විය යුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, මානව සම්පත් සංවර්ධන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම එහි ඇතුළත් වී නොතිබුණි.

(ආ) 1973 අංක 10 දරන සභාධිපත්‍ය දේපළ කළමනාකරණ අධිකාරිය පනත සංශෝධන කටයුතු 2015 අගෝස්තු මාසයේදී අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, 2016 ක්‍රියාකාරී සැලැස්ම අනුව 2016 පෙබරවාරි දක්වා එම කාලය දීර්ඝ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම කටයුතු අවසන් කර නොතිබුණු අතර අදාල පනත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 15 සිට සියයට 87 දක්වා වෙනස්කම් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

--------------------------------

අධිකාරිය විසින් 2013, 2014 සහ 2015 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | සභාධිපත්‍ය දේපල කළමනාකරණය | - කළමනාකරණ සංස්ථා අධීක්ෂණය විධිමත් නොවීම.<br>- සභාධිපත්‍ය දේපලවල පොදු පහසුකම් පැවරීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු නොකිරීම.<br>- අනවසර ඉදිකිරීම් සම්බන්ධ වාර්තා පවත්වා නොතිබීම. |
| (ආ) | ලේඛන පවත්වා ගැනීම | - බඩු වට්ටෝරු පොත් පවත්වා නොතිබීම<br>- දුරකථන, ජලය, විදුලිය හා ඉන්ධන වියදම් පාලනය සඳහා ලේඛන පවත්වා නොතිබීම. |
| (ඇ) | මූල්‍ය පාලනය | - විධිමත් ආකෘතියකින් හා පාලනයකින් තොරව අග්‍රිම ඉල්ලුම් කිරීම හා වියදම් කිරීම. |
| (ඈ) | වාහන පාලනය | - වාහන වලට අදාල ධාවන සටහන් විධිමත් ලෙස පවත්වා නොතිබීම හා විගණකාධිපති වෙත යොමුකර නොතිබීම.<br>- වටිනාකම වාර්ෂිකව තක්සේරු කිරීමකින් තොරව වාහන රක්ෂණය කර තිබීම. |